# ත්‍රිකෝණයක කොන් තුනකි
# ආහාරය, පෝෂණය හා මන්ද පෝෂණය

* නෙත් යුගලක් මෙන් එකිනෙකට ආසන්නව පැවති ආහාර හා පෝෂණය අසලට බලාපොරොත්තු නොවූ ලෙස මන්දපෝෂණය ළං වී ඇත්තේ එම තුන් ප්‍රශ්නයම ත්‍රිකෝණයක කොන් තුන මෙන් වන සේය.

* මන්ද පෝෂණය, වතු කරයට පමණක් සීමාවූ ප්‍රශ්නයක් නොව, වතුකරයේ වේවා ගමේ වේවා, නගරයේ වේවා මුළු මහත් ශ්‍රී ලංකා වටම මුහුණ දීමට සිදුව ඇති ප්‍රශ්නයක් වන්නේ ය.

* මන්ද පෝෂණය පිළිබඳ ප්‍රශ්නයට පිළියම් යෙදීමේ දී අප මුලින් ම යොමු විය යුත්තේ වතු කරය දෙසට ය. ඊට සැහෙන හේතු ඇත. වතුකරයේ ජනගහනය ලක්ෂ 16 ක් පමණ වෙයි. එය රටේ මුළු ජනගහණයෙන් සියයට 12 සිට 13 දක්වා ප්‍රමාණයකි. එහෙත් අපේ අපනයන නිෂ්පාදනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් නිපදවන අවුරුදු 150 ක සංවිධානාත්මක ඉතිහාසයක් ඇති වතුකරයට ලැබී ඇත්තේ රටේ සෙසු කොටස් භුක්ති විඳින සමාජ සුභ සාධනයන් ගෙන් හා වර ප්‍රසාද වලින් ඉතා අඩුකොටසකි. යූනිසෙෆ් ආයතනයේ සංඛ්‍යාලේඛන වලට අනුව ශ්‍රී ලංකවේ ළදරු මරණ අනුපාතය සියයට 51.2 කි එය සමහරවිට තුන්වන ලෝකයේ අඩුම අනුපාතය විය හැකිය. එහෙත් වතුකරයේ එය සියයට 93.6 ක් තරම් ඉහළ බව කිව යුතු ය. එය කුමන හෝ තැනකින් සිදු වූ කුමන හෝ වරදක ප්‍රතිඵලයකි.

* මන්දපෝෂණය ඉදිරි දශකය තුළ අප විසින් තරණය කළ යුතුව ඇති සමාජ බාධකයෙකි.

* ජනගහනයේ වර්ධනය පාලනය නොකොට අපට කිසි විටෙකත් මන්දපෝෂණය පිළිබඳ ප්‍රශ්නය විසඳිය නොහැකි වනු ඇත.

* විධිමත් අර්ථාන්විත ජනගහන වැඩ පිළිවෙලක් නැතිනම් කිසිදු සංවර්ධන වැඩ පිළිවෙලක් සාර්ථක නොවනු ඇත. වැඩි වන ජනගහනය සම්බන්ධයෙන් කිසිවක් නොකළ හොත් සංවර්ධනයේ සියලු ජයග්‍රහණයන් ශූන්‍යත්වයට පත් වනු නොවැළැක් විය හැකිය. එය හාන්සිපුටුවලට බර වූ විවේචකයන් ද ඇතුළුව කා විසිනුත් තේරුම් ගත යුතු වූවකි.

* ආදායම් මට්ටම වැඩි වීම මතම පෝෂණ තත්ත්වයේ වැඩිවීමක් බලාපොරොත්තු විය නොහැකිය. සමාජයේ දිළිඳුම කොටස් ගැන සලකන විට පෝෂණයට ආදායම අදාළ විය හැකි වුවත් යමක් කමක් ඇති අය අතරේ ද මන්ද පෝෂණයෙන් පෙළෙන අය සිටින බව කිව යුතු ය. ඒ අයෝග්‍ය ආහාර නිසා ය.

වෙළඳ හා නාවික ඇමති

**ලලිත් ඇතුලත්මුදලි**

(ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පැවති ආහාර හා පෝෂණය පිළිබඳ සම්මන්ත්‍රණයක දී.)